*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# ඉතිහාසය

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

**I කොටස**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01 .................................................... ඔබේ පාසලේ ඉතිහාසය ඉගෙනීමේදී නිවැරදි තොරතුරු ලබාගැනීමට උදව් කරගත හැකි ලිඛිත මූලාශ්‍රයකි. (පාසලේ වාර්ෂික සඟරාව / අත්සන් පොත / ලොග් පොත)

02 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුපුන් ඉපදුනේ ක්‍රි: ව: 2007 දී ය. ඔහුගේ උපන් වර්ෂය බුද්ධ වර්ෂවලින් දක්වූ විට බු.ව. ............................................................. වේ. (බුඃ වඃ 2551 / බුඃ වඃ 2552 / බුඃ වඃ 2554)

03 විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කොට නිවාස සැදුවේ ................................................................. මානවයාය. (හෝමෝ ඉරෙක්ටස් / හෝමෝ නියන්ඩර්තාලෙන්සිස් / හෝමෝහැබිලස්)

04 ඊජිප්තු ශිෂ්ටාචාරය දීර්ඝ කාලයක් පාලනය කළේ ............................................ රජ පෙළපතයි. (මෞර්ය / පාරාවෝ / මූගල්)

05 මෙරට ජනාවාස බිහි කළ මිනිසුන් සිටි මුල් යුගය හඳුන්වන්නේ ................................................ ලෙසිනි. (ගල්යුගය / පේලියොසොයික / සිලූරියන්)

- **අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.**

06 ඉතිහාසය පිළිබඳ දැනුම ලබා ගැනීමට උදව් කරගත හැකි හැම දෙයක් ම මූලාශ්‍ර වේ. ( )

07 මුස්ලිම්වරු ඔවුන්ගේ ආගමික උත්සව පැවැත්වීමේදී කාලය මැන ගැනීමට භාවිතා කළේ ශකවර්ෂ ක්‍රමයයි ( )

08 විවිධ වර්ණ යොදාගෙන ගල් පර්වත මත චිත්‍ර ඇන්දේ මධ්‍ය ශිලා යුගයේ මිනිසුන් ය. ( )

09 විජය කුමරු ගොඩබට තම්බපණ්ණිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටි ස්ථානයකි. ( )

10 නගරයක් අසල පළමුවරට වැවක් ඉදිකළේ පණ්ඩුකාභය රජුය. ( )

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 පෘථිවිය බිහි වූ මුල් අවධියේ ආහාර ගැනීමට මුඛයක් හා ඇස්පහක් පිහිටි මුහුදු පතුලේ ජීවත් වූ සතා හඳුන්වන නම කුමක් ද?

(1) ප්‍රොකායෝට් බැක්ටීරියාව (2) ඔපබීනියා

(3) හැකරැල්ලන් වැනි සතුන් (4) ගොළුබෙල්ලා

12 මිනිසා ආගමික කටයුතු වලට නැඹුරු වීමක් පෙන්නුම් කරන්නේ මින් කුමන යුගයේ ද?

(1) නව ශිලා යුගය (2) මධ්‍යශිලා යුගය (3) පූර්වශිලා යුගය (4) ගල් යුගය

13 ඉන්දියාව දෙසට ව්‍යාප්ත වූ හෝමෝ සාපියන්වරු හැඳින්වූයේ කුමන නමින් ද?

(1) මොංගොලොයිඩ් (2) නීග්‍රොයිඩ් (3) කොකසොයිඩ් (4) ඔස්ට්‍රලොයිඩ්

14 පිලිස්සූ මැටි ගඩොල් භාවිතා කර නිවාස සැදූයේ කුමන ශිෂ්ටාචාරවල වැසියන් ද?

(1) ඉන්දුනිම්න වැසියන් ය. (2) යුප්‍රටීස් ටයිග්‍රීස් නිම්න වැසියන් ය.

(3) ඊජිප්තු ශිෂ්ටාචාර වැසියන් ය. (4) හොවැංහෝ නිම්න වැසියන් වැසියන් ය.

15 ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ඉදිකළ වැව වර්තමානයේ හඳුන්වන නම වන්නේ මින් කුමක් ද?

(1) තිසා වැව (2) මින්නේරිය වැව (3) බසවක්කුලම වැව (4) මහවිලච්චිය වැව

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.**

16 මෙසපොතේමියානු ශිෂ්ටාචාරය අයත් ප්‍රදේශය වර්තමානයේ හඳුන්වන්නේ .................................. ලෙසටයි.

17 ඊජිප්තු චිත්‍රාක්ෂර නිර්මාණය කළේ නොයෙක් සතුන්ගේ සහ ...................................................................... වල රූප භාවිතා කොටය.

18 සද්ධාතිස්ස රජු ආහාර සුලබ කිරීමට ගොවිතැන් කටයුතු කළේ ...................................................................... ප්‍රදේශයේය.

19 ඓතිහාසික මූලාශ්‍ර වල මහා ථූපය නමින් හැඳින්වූ ස්ථූපය ගොඩනැගුවේ .................................................. රජතුමාය.

20 වළගම්බා රජ තම බිසව වූ සෝමා දේවිය සතුරන් ඉදිරියට ගිය තැන සිහි වීමට ............................................ නමින් විහාරයක් කරවීය. (ලකුණු 2 × 20 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.




01. ලෝක සිතියම උදව් කරගෙන පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) නීග්‍රොයිඩ මානව වර්ගය ව්‍යාප්ත වූ අප්‍රිකාව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

(ii) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)

(iii) ලංකාවට බුදු දහම එවීමට දායක වූ අශෝක අධිරාජයා පාලනය කළ රට දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 02)



A

(iv) A අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමන මානවයාගේ හිස්කබල ද? (ල. 02)

(v) A අක්ෂරයෙන් දැක්වෙන මානවයා සතු හැකියාවන් 2ක් ලියන්න. (ල. 02)

B



(vi) B අක්ෂරයෙන් දැක්වෙන පින්තූරය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් පූජකයකුගේ යැයි සිතිය හැකි පින්තූරයකි. ඔහු උසස් පුද්ගලයෙකු ලෙස දැක්වීමට තිබූ සංකේතය කුමක් ද? (ල. 02)

(vii) ඔහු සිටින්නේ කුමන ඉරියව්වකින්ද? (ල. 02)

(viii) (අ) C අක්ෂරයේ පින්තූරයෙන් දැක්වෙන දාගැබ නම් කරන්න.

(ආ) එම දාගැබ ඉදිකළ රජතුමා කවුද? (ල.02) (ල.16)

C



02 පහතින් දක්වා ඇත්තේ අතීත මානවයා සතු හැකියා කිහිපයකි.

- ★ පාද දෙකින් ඇවිදයාම
- ★ ගලකින් තවත් ගලකට ගසා පතුරක් ඉවත් කර මුවහත් ආයුධයක් සාදා ගැනීම
- ★ හොඳ දඩයක්කාරයෙකු වීම
- ★ සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස සෑදීම
- ★ එළවලු වර්ග පිස ආහාරයට ගැනීම
- ★ අදහස් හුවමාරු කර ගැනීමට භාෂාව භාවිතා කිරීම
- ★ චිත්‍ර ඇඳීම වැනි හැකියා තිබීම.

(i) මේ අතරින් හෝමෝ නියැන්ඩර් තාලෙන්සිස් මානවයා සතු ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) නව ශිලා යුගයේ මිනිසා දෙවියන් ඇදහීමට යොමු වීමට බල පෑ අරමුණු 02 ක් ලියන්න. (ල. 04)

(iii) පහත සඳහන් කාරණා සම්බන්ධව මධ්‍ය ශිලා යුගයේ මිනිසුන් භාවිතා කළ ක්‍රමවේද මොනවා ද?

- දඩයම් කිරීම
- ආහාර ලෙස භාවිතා කළ දේවල්
- නිවාස සාදා ගැනීම
- චිත්‍ර නිර්මාණය කිරීම (ල. 04)

03 (i) මෙසපොතේමියානු වැසියන්ගේ වන්දනාවට ලක් වූ දෙවිවරු තුන්දෙනෙක් නම් කරන්න. (ල. 03)

(ii) ඉන්දු නිම්න වැසියන් භාවිතා කළ ලෝහ වර්ග 04 ක් නම් කරන්න. (ල. 04)

(iii) (අ) D අක්ෂරයෙන් දක්වෙන පින්තූරයේ පෙන්නුම් කරන්නේ කුමක් ද? (ල. 02)

(ආ) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් හොඳින් සැලසුම් කළ නගර 02 ක් නම් කරන්න. (ල. 02)



D

04. (i) ඊජිප්තු ශිෂ්ටාචාරය නිර්මාණය වීම පිළිබඳ පහත ප්‍රකාශ වලට පිළිතුරු සපයන්න.

- ★ ශිෂ්ටාචාරය ගොඩනැගුන ගංගා නිම්නය
- ★ ශිෂ්ටාචාරය ගොඩනැගුන මහද්වීපය

(1½ + 1½ = 03)

(ii) දී ඇති පින්තූර හා උපකාරක පද ඇසුරු කරගෙන පහත දක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

(1) පාරාවෝ රජවරුන්ගේ මිනී තැන්පත් කළ ගොඩනැගිලි මේ නමින් හැඳින්වේ.

(2) පාරාවෝ රජෙක් වූ අක්හෙනතන්ගේ බිරිය හඳුන්වන්නේ මේ නමිනි.

පහළට

(1) ඊජිප්තුව ලොවට හඳුන්වා දුන් ක්‍රියාවලියකි.

(2) රනින් කළ වෙස්මුහුණකින් මමියක මුහුණ ආවරණය කළ රජු




(ල. 04)

(iii) පහත වගුව සම්පූර්ණ කරන්න.

| ශිෂ්ටාචාරය | කෘෂිකර්මයේ දී සිදුකළ කාර්යය |
|---|---|
| (i) ...................................... | ගොවිතැනේ දී බිම සකස් කිරීමට ලෝහ නගුල් හා ගලින් තැනූ උදලු භාවිතා කිරීම |
| (ii) ...................................... | දියුණු වාරි පද්ධතියක් නිපදවීම |

(ල. 04)

05 (i) ගල් යුගයේ මිනිසා ආහාරයට ගත් ශාක ආහාර 03 ක් නම් කරන්න. (ල. 03)

(ii) විජය කුමරු සමඟ පැමිණි කුමාරවරු දෙදෙනෙක් නම් කර ඔවුන් පිහිට වූ ජනාවාස 02 ක් දක්වන්න. (ල. 04)

(iii) පණ්ඩුකාභය රජු අනුරාධගාම අනුරාධ පුරය බවට පත් කිරීමට කළ කාර්යයන් 04 ක් ලියන්න. (ල. 04)

06 (i) පහත සඳහන් ප්‍රකාශ සැලකිල්ලෙන් කියවා ථූපාරාමය ඉදිකිරීමට සම්බන්ධ ප්‍රකාශ 03 ක් තෝරා ලියන්න.

- ★ ඉන්දියාවේ රාම ගාම දාගැබේ තිබූ ධාතු වැඩමවා තැන්පත් කිරීම
- ★ සමස්ත ලෝකයෙන්ම ඉදි වූ විශාලම ගඩොළු ස්තූපය වීම
- ★ දකුණු අකුධාතුව තැන්පත් කර තිබීම
- ★ පටී ධාතුව තැන්පත් කර තිබීම
- ★ ආරක්ෂාවට වසභ රජු වටදාගෙයක් ඉදිකර තිබීම
- ★ මුල් යුගයේ ධාන්‍යාකාර හැඩයක් ගෙන පසුව ඝණ්ඨාකාර හැඩයක් ගැනීම. (ල. 03)

(ii) මිහිඳු මහරහතන් වහන්සේ සමඟ ලංකාවට වැඩම කළ රහතන් වහන්සේලා 04 නමක් සඳහන් කරන්න. (ල. 04)

(iii) පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| රජ | නිර්මාණය කළ ස්තූපය | නිදන් කළ දේවල් |
|---|---|---|
| ● දේවානම්පියතිස්ස රජ | ථූපාරාමය | (1) .................................. |
| ● දුටුගැමුණු රජ | (2) ........................................... | බුදුන්වහන්සේගේ ශාරීරික ධාතු |
| (3) ............................................ | ජේතවන දාගැබ | පටී ධාතුව |
| ● වළගම්බා රජ | (4) .......................................... | නිදන් කළ දෙයක් පිළිබඳ සඳහන් නොවීම |

(ල. 04)

07 (i) ධාතුසේන රජතුමා පිළිබඳව පහත ප්‍රකාශ වලට සම්බන්ධව තොරතුරු සඳහන් කරන්න.

- ධාතුසේන රජුගේ පියා
- සහෝදරයා
- ඔහුගේ රාජ වංශය (ල. 03)

(ii) පහත වගුවේ සඳහන් වන්නේ වසභ රජ හා මහසෙන් රජු විසින් ඉදිකළ වැව් කීපයකි. ඒවා හඳුන්වන වර්තමාන නම් ලියන්න.

| | අතීත නම | වර්තමාන නම |
|---|---|---|
| (1) | මයෙන්ති වැව | ..................................................... |
| (2) | මනාකැටිය වැව | ..................................................... |
| (3) | වාත මංගණ | ..................................................... |
| (4) | වල්ලූර වාපි | ..................................................... |

(ල. 04)

(iii) දුටුගැමුණු රජතුමා වැනි රජවරුන් සිටි ඉතිහාසයක් ඇති රටක උපන් ඔබ වාසනා වන්ත දරුවෙකි. එතුමාගේ චරිතයේ ඇති ඔබට ආදර්ශයට ගත හැකි චරිත ලක්ෂණ 04 ක් සඳහන් කරන්න. (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ලොග්පොත 02. බු:ව: 2551 03. හෝමෝ නියන්ඩර්තාලෙන්සීස් 04. පාරාවෝ රජ පෙළපතයි 05. ගල්යුගය
06. (✓) 07. (✗) 08. (✓) 09. (✗) 10. (✓) 11. ඔපබීනියා 12. නව ශිලා යුගය
13. ඔස්ට්‍රලොයිඩ් 14. ඉන්දු නිම්නය 15. බසවක්කුලම 16. ඉරාකය 17. භාණ්ඩ වල
18. දිගාමඩුල්ල 19. දුටුගැමුණු රජ 20. සෝමාරාමය (2 x 20 = ල. 40)

## II කොටස

01. (i) A
(ii) B
(iii) C
(iv) ඔස්ට්‍රොලොපිතිකස්
(v) දෙපයින් ඇවිදයාම, රවුම් ගල් කැට වලින් විවිධ ඇට වර්ග තලා කෑම
(vi) නළලේ දක්නට ඇති පටිය
(vii) සන්සුන්ව භාවනාවේ යෙදී සිටිමින්
(viii) ජේතවන දාගැබ (ල. 2 × 8= 16)

02. (i) විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කොට නිවාස තැනිම
එළවලු පිස ආහාරයට ගැනීම
දක්ෂ දඩයක්කාරයකු විම (ල. 03)
(ii) ගොවිතැන් කටයුතු ආරක්ෂා කර ගැනිම
සතුන් ආරක්ෂා කර ගැනිම (ල. 2 × 2= 4)
(iii) දඩයම් කිරීමට : - දුනු, ඊතල භවිතා කිරීම
ආහාර : - ගස්වල ගෙඩි, කොළ වර්ග හා අලවර්ග
නිවාස : - දැව දඬු හා කොළ අතු භාවිතා කරමින් නිවාස තැනීම
චිත්‍ර නිර්මාණයඃ - නොයෙක් වර්ණ යොදා ගෙන පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම (ල. 04)

03. (i) අනු, එන්කිකි, එන්ලිලි (ල. 03)
(ii) තඹ, ලෝකඩ, ඊයම්, ටින් (ල. 04)
(iii) (අ) පුරාවිද්‍යාත්මක තැනීම් වලින් සොයාගත් ඉන්දු නිම්න නගරයක්
(ආ) මොහොන්ජදාරෝ, හරප්පා, කාලිබන්ගන්, ධොලවීර (ල. 04)

04. (i) (අ) ශිෂ්ටාචාරය ගොඩනැගු ගංගා නිම්නය - නයිල් (ල. 01 1/2)
(ආ) ශිෂ්ටාචාරය ගොඩනගන මහද්වීපය - අප්‍රිකාව (ල. 01 1/2) (ල. 03)
(ii) ප්‍රහේලිකාව - හරහට (1) පිරමීඩ
(2) නෛනෛවුටෙන් නෛටීටි
පහළට (1) මමීකරණය
(2) ටූටන්කාමන් (ල. 04)
(iii) වගුසටහනේ
(i) මෙසපොතේමියාව
(ii) ඊජිප්තුව (ල. 04)

05. (i) වල්දෙල්, වල්කෙසෙල්, කටු අල (ල. 03)
(ii) උපතිස්ස ඇමති - උපතිස්ස ගාම
අනුරාධ ඇමති - අනුරාධ ගාම (ල. 04)
(iii)
- ප්‍රදේශය වටා සීමාව ලකුණු කිරීම
- තම ප්‍රදේශය වටා ආරක්ෂාවට දිය අගලක් ඉදිකිරීම
- ප්‍රධාන දිශා හතරේ දොරටු 04 ක් ඉදිකිරීම
- මාර්ග පද්ධතිය ඉදිකිරීම
- උද්‍යාන පොකුණු ඉදිකිරීම (ල. 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

06. (i)
- ★ දකුණු අකු ධාතුව තැන්පත් කිරීම
- ★ වසභ රජු වටදාගෙයක් ඉදිකිරීම
- ★ මුල් යුගයේ ධාන්‍යාකාර වීම පසු කාලයේ ඝණ්ඨාකාර වීම (ල. 03)

(ii) ඉට්ඨීය, උත්තිය, සම්බල, බද්දසාල (ල. 04)

(iii) 1 - අකුධාතුව
2 - රුවන්වැලිමහා සෑය
3 - මහසෙන් රජතුමා
4 - අභයගිරි දාගැබ (ල. 04)

07. (i)
- ධාතුසේන රජුගේ පියා - දාඨානාම
- සහෝදරයා - සලතිස්බෝ
- රාජවංශය - මෞර්ය (ල. 03)

(ii)
1. මයෙන්ති වැව - මහවිලච්චිය වැව
2. මානකැටිය වැව - මන්නන්කට්ටිය වැව
3. වාතමංගණ - නොච්චිපොතාන වැව
4. වල්ලුරවාපි - හුරුළු වැව (ල. 04)

(iii) සැලසුම්සහගත බව
බුද්ධිමත් බව
ධෛර්‍යවන්ත බව
රටට ආගමට හිතවත් බව
ගරුකළ යුත්තන්ට ගරු කිරීම
රට වැසියන්ට ආදරය කිරීම යන සේවාවන් 04 ක් දැක්විමට (ල. 04)